තුනුක්කායි ප්‍රාදේශිය සභාව

මුලතිව් දිස්ත්‍රික්කය.

------------------------------------

1. මුල්‍ය ප්‍රකාශ

-----------------

1.1 මුල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 14 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශ 2013 ජුනි 25 දින ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 19 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 මතය

----------

මෙම වාර්තවේ 1.3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් මුල්‍ය ප්‍රකාශයන්ට වන බලපෑම හැර, 2013 දෙසැම්බර් 31 දිනට තුනුක්කායි ප්‍රාදේශිය සභාවේ වැඩකටයුතු වල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් වල මුල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව මුල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මුල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

i. මුල්‍ය ප්‍රකාශයන්හි නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු ආදායම්, වගකීම් සහ වත්කම් යටතේ පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි බලපෑම | ආදායම් | | වගකීම් | | වත්කම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| අඩුවෙන් දැක්වීම් | 01 | 3,649,570 | 01 | 16,650 | - | - |
| වැඩියෙන් දැක්වීම් | - | - | - | - | 02 | 300,529 |

ii. රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් සභාවට පරිත්‍යාග කරන ලද වාහන 11 ක් අගය කර ගිණුම්ගතකර නොතිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

ප්‍රධාන ලෙජරය අනුව ගිණුම් විෂයයන් 3 ක එකතුව රු.188,327 ක් වූ අතර අවසාන ගිණුම් අනුව ඒවායේ එකතුව රු.893,700 ක් වූයෙන් රු.705,373 ක වෙනසක් පෙන්නුම් කෙරිණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා රු.61,000 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභා ( මුල්‍ය සහ පරිපාලන) රීති | | |
| II පරිච්ඡේදයේ 66 වගන්තිය | - | රු.2,254,231 ක් වූ හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 | - | වර්ෂ 2 ඉක්ම වූ රු.123,249 ක් වූ විවිධ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

2. මුල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

------------------------------------------

2.1 මුල්‍ය ප්‍රතිඵල

-------------------

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශ අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු.3,827,730 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.601 ක් විය.

2.2 මුල්‍ය පාලනය

------------------

අයවැය ලේඛනය නිසි පරිදි පිළියෙල කර නොතිබු බැවින් අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් සහ වියදම් අතර පිළීවෙලින් රු.2,820,577 ක් සහ 1,443,804 ක් වූ වෙනස්කම් පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය

--------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

----------------------------------------------------------------------

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 3,821 | 3,606 | - |
| බදු කුලි | 216 | 400 | - |
| බලපත්‍ර ගාස්තු | 205 | 264 | - |
| වෙනත් ආදායම් | 7,286 | 10,078 | 2,254 |
| | 11,528 | 14,348 | 2,254 |

2.3.2 උසාවි දඩ

---------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු උසාවි දඩ රු.1,564,450 ක් අයවිය යුතු මුදල් ලෙස ගිණුම් ගතකර තිබුණු නමුත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 ආදායම් කළමනාකරණය

--------------------------------

(i) සමාලෝචිත වර්ෂය සඳහා කඩ කුලී, ත්‍රීරෝද රථ කුලි, සහ බදු කුලි රු.689,781 ක් අයකර නොතිබුණි.

(ii) ප්‍රාදේශිය සභා සිමාව තුල වු විදුලි සංදේශන කුළුණු 03 ක් සඳහා බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

(iii) සභා සීමාව තුලවූ ප්‍රදර්ශන පුවරු සඳහා දැන්වීම් ප්‍රචාරණ ගාස්තු අයකර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

--------------------------------

i. පරිත්‍යාග ලෙස ලැබී තිබුණු පහත සඳහන් විෂයයන් භාවිතයට නොගෙන ගබඩාවේ තබා තිබුණි.

| විෂයය | ප්‍රමාණය | පරිත්‍යාගකරු | පරිත්‍යාග කළ වර්ෂය |
|---|---|---|---|
| උදළු | 63 | රතුකුරුස සමාජය | 2010 |
| සවල | 44 | රතුකුරුස සමාජය | 2010 |
| රේක්ක | 49 | රතුකුරුස සමාජය | 2010 |

ii. උතුරු නැගෙනහිර පළාත් සංවර්ධන වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුල ඉදිකරන ලද පිරිවැය රු.2,708,102 ක් වූ ඉයන් කුලම් වෙළඳ පොල මෙම වාර්තාවේ දිනය දක්වාම උපයෝජනය කර නොතිබුණි.

2.5 සමාලෝචිත වර්ෂය තුල පිරිවැය රු.800,000 කට ගොඩනගන ලද කාල්විලාන් බහාළුවෙහි අත්තිවාරම් මට්ටමෙහි කැඩී යාම්, බොහෝ ස්ථාන වල බිත්ති ඉරි තැලීම්, ජනෙල් අගුළු සහ යතුරු වලට හානි වීම් වැනි බොහෝ අඩුපාඩු පැවතුණි. වහලට ආසන්න ප්‍රදේශය සායම් ආලේප කර නොතිබුණි.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------------

සමාලෝචිත වර්ෂය තුල යුනිසෙෆ් ආයතනය විසින් ගම්වාසීන්ට ජලය පවිත්‍ර කිරීමේ උපකරණ නිෂ්පාදනය කිරීමට පුහුණු කර තිබුණු අතර රු.916,045 ක් ද ප්‍රදානය කර තිබුණි. මෙම මුදල කිසිදු ප්‍රයෝජනයකට නොගෙන විවිධ තැන්පතු ගිණුමෙහි තබා තිබුණි.

3. පද්ධති සහ පාලන

--------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය

(අ) පරිත්‍යාග

(ආ) වාහන උපයෝජනය

(ඇ) ආදායම් අයකර ගැනීම

(ඈ) ආපසු ගෙවිය යුතු තැන්පතු

(ඉ) ගබඩා